# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2420/39 – 2025 ජනවාරි මස 22 වැනි බදාදා – 2025.01.22**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

#### 39(1) වැනි වගන්තිය යටතේ ප්‍රත්‍යාදිෂ්ය කිරීම

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පනවන ලද්දාවූ ද, අංක 1944/6 හා 2015.12.07 වැනි දින දරන රජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද්දාවූ ද, 2015 අංක 199 හා 2015.12.03 වැනි දින දරන ආඥාවේ සවිස්තරව දැක්වෙන ඉඩම් කොටස් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත පැවරී තිබේ. මෙහි පහත විස්තර වන එම ඉඩම් කොටස්වල භුක්තිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවෙන් තවම භාරගෙන නොමැත. එබැවින්, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය, කුරගමගේ දොන් ලාල් කාන්ත වන මම ඉඩම් අත්කර ගැනීමේ පනතේ 39(1) වැනි වගන්තිය යටතේ මාහට පැවරී ඇති බලතල අනුව අංක 1944/6 හා 2015.12.07 වැනි දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ඉහත සඳහන් 2015 අංක 199 හා 2015.12.03 වැනි දින දරන ආඥාවේ පහත උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස් පමණක් මෙම නියමය මඟින් ප්‍රත්‍යාදිෂ්ය කරමි.

**කේ. ඩී. ලාල් කාන්ත,**
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම්
සහ වාරිමාර්ග අමාත්‍ය.

මගේ අංකය: 4-3/10/2012/LRB/186.
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරිගේ අංකය: WGSWD&EIP/ACQ/DW/05.

2025 ජනවාරි මස 08 වැනි දින,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
මිහිකත මැදුර, ඉඩම් මහලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, දෙහිවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 537**B**, කොහුවල උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කළුබෝවිල (කොට්ඨාස අංක 3 - කොහුවල, දෙහිවල, ගල්කිස්ස මහ නගර සභා සීමාව තුළ) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක CO/DSO/2023/452 හා 2024.04.19 දිනැති අනුරේඛනයේ දැක්වෙන පහත නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර 'U' – කොටුවේකුඹුර සහ ප්‍රියන්කරයාගේ කුඹුර – ප්‍රමාණය:හෙක්. 0.2121**

උතුරට: කැබලි අක්ෂර T සහ V; නැගෙනහිරට: කැබලි අක්ෂර Vසහ W; දකුණට: කැබලි අක්ෂර W සහ X; බටහිරට: කැබලි අක්ෂර X සහ T.

EOG 01 – 0227

---

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

#### 39(ආ)(1) වැනි වගන්තිය යටතේ නියමය

2015 දෙසැම්බර් මස 07 දින අංක 1944/6 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි*



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළකරන ලද 2015 අංක 199 දරන ආඥාවේ සඳහන් ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන්ම සතු වී ඇති අතර රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම කොටසේ සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය කුරගමගේ දොන් ලාල් කාන්ත වන මම එකී ඉඩම් කොටස් අතුරින් මෙහි පහත උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස් පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

**කේ. ඩී. ලාල් කාන්ත,**
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම්
සහ වාරිමාර්ග අමාත්‍ය.

මගේ අංකය: 4-3/10/2012/LRB/186.
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරිගේ අංකය: WGSWD&EIP/ACQ/DW/05.

2025 ජනවාරි මස 08 වැනි දින,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
මිහිකත මැදුර, ඉඩම් මහලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, දෙහිවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 537**B**, කොහුවල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කළුබෝවිල (දෙහිවල ගල්කිස්ස මහ නගර සභා සීමාව තුළ) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක 520801 හා 2023.03.15 දිනැති කැඩැස්තර සිතියමේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම් වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අංක ‘8’ – දික්දෙනිය කුඹුර, මිල්ලගහඔවිට සහ කොටුවේ කුඹුර – ප්‍රමාණය : හෙක්. 0.0027**
උතුරට: පත්‍ර 5 හි කැබලි අංක 193 සහ මෙම පිඹුරේ කැබලි අංක 9; නැගෙනහිරට: පත්‍ර 5 හි කැබලි අංක 193 සහ මෙම පිඹුරේ කැබලි අංක 9 සහ 12; දකුණට: කැබලි අංක 9,12,13 සහ 7; බටහිරට: කැබලි අංක 7 සහ පත්‍ර 5 හි කැබලි අංක 193.

02. **කැබලි අංක 12 – දික්දෙනිය කුඹුර, මිල්ලගහඔවිට සහ කොටුවේ කුඹුර – ප්‍රමාණය : හෙක්. 0.0012**
උතුරට: කැබලි අංක 8, 9 සහ 10; නැගෙනහිරට: කැබලි අංක 9, 10, 11 සහ 14; දකුණට: කැබලි අංක 14 සහ 13; බටහිරට: කැබලි අංක 13, 7 සහ 8.

EOG 01 – 0228

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.